# මහජනතාව වෙත කරන දැනුම්දීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම
## 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

### අතපත්තු මුදියන්සේලාගේ දම්මික කුමාර අතපත්තු
### (ජා.හැ.අ. 693041988V)
### සහ
### ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 125740)

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 42 වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත දැක්වෙන පුද්ගලයා සහ ආයතනය පිළිබඳ සිදු කරන ලද විමර්ශනයෙහි ප්‍රතිඵල අනුව 2020.09.15 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී "සමන් කැකුල", ඇඹලව, දෙමටළුව කුරුණෑගල පදිංචි/ පිහිටා ඇති අතපත්තු මුදියන්සේලාගේ දම්මික කුමාර අතපත්තු යන අය සහ ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටරනැෂනල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් ඉහත කී පනතේ විධි විධාන උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යන ලද බව හෝ තැන්පතු භාර ගෙන ඇති බව නිශ්චය කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයාට සහ සමාගමට කිසිදු ආකාරයකින් තැන්පතු භාර ගැනීම හෝ වෙනත් අරමුදල් රැස් කිරීම, වත්කම් බැහැර කිරීම / අන්සතු කිරීම, යම් ගිණුමකට දේපළකට හෝ ආයෝජනයකට සම්බන්ධ ගනුදෙනුවකට ඇතුළුවීම තහනම් කරමින් මේ වන විටත් නිකුත් කර ඇති ක්‍රියාවිරහිත කිරීමේ නියෝගය ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම මත කොළඹ මහාධිකරණය විසින් 2021.07.12 දින දක්වා දීර්ඝ කරන ලදී.

තවද, මේ සම්බන්ධයෙන් ඉහත කී පනතෙහි විධි විධාන යටතේ අපරාධ නඩු පැවරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් යොමු කර ඇති බව මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ**
**බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

011-2477000, 011-2440330, 011-2330220 dsnbfi@cbsl.lk www.cbsl.gov.lk